වික්ටෝරියානු රජය විසින්, වික්ටෝරියානු පවුල්වලට පෙරපාසැල් සොයා ගැනීම පහසු කරවීමට නව ලකුණක් හඳුන්වා දී තිබේ. එය Kinder Tick නම් වේ.

පෙරපාසැලක් හෝ පූර්ව ළමාවිය සේවා පවත්වාගෙන යන ගොඩනැගිලිවලට ඇතුළු වන විට ඔබට මෙම ලකුණ දැකිය හැකි වනු ඇත. ඔවුන්ගේ වෙබ් අඩවිවල ද ඔබට මෙම සංකේතය දැකිය හැකි වීමට ඉඩ ඇත.

මෙම පෙරපාසැල් සේවාවන්, දරුවන්ගේ අධ්‍යාපනයට ඉතාමත් වැදගත් වේ.

Kinder Tick පහත ආකාරයට දැක් වේ.

KINDERGARTEN

Victorian Government Approved

මෙම හරි ලකුණින් අදහස් වන්නේ, එම සේවාවන් සඳහා වික්ටෝරියානු රජයෙන් අරමුදල් සැපයෙන බවයි.

ඔබගේ දරුවන් සුදුසුකම් ලත් ගුරුවරුන්ගෙන්, කෙළි සෙල්ලම් තුළින් ඉගෙනීම සිදු කරනු ඇත.

උදාහරණයක් ලෙස, ඔවුහු භාෂාව, ඉලක්කම් හා රටා ගැන ඉගෙන ගනිති. මිතුරන් තනා ගන්නා ආකාරය මෙන් ම බෙදා හදා ගැනීමට හා අනෙකාට සවන් දීමට ද ඉගෙන ගනිති. පාසැල් යාමට සූදානම් කරවන්නා වූ වෙනත් හැකියාවන් ද ඔවුන්ට ලබා ගත හැකිය.

2022 සිට, වික්ටෝරියානු දරුවන්ට, පාසැල් යාමට පෙර වසර දෙකක් පෙරපාසැල් යාම සිදු කළ හැකිය.

පෙර පාසැල් වැඩසටහන, ළමා රැකවරණ සැපයීමේ කොටසක් විය හැකිය. එමෙන් ම එය වෙනත් වැඩසහනක් ලෙස ද පැවතීමට හැකි වේ.

ඔබේ ප්‍රජාව තුළ Kinder Tick  ලකුණ දැකීමට විමසිලිමත් වන්න. ඔබට වැඩිදුර තොරතුරු අවශ්‍ය නම්, පෙරපාසැලේ ගුරුවරුන්ට කතා කරන්න.